

දේශීය පාපන්දුවට පයින් නොගසන ශ්‍රී ලාංකිකයා
කසුන් ජයසුරිය

කසුන් සේනාරත්න

පාපන්දු ක්‍රීඩාවෙන් අවම වශයෙන් ශ්‍රී ලංකාවට තවමත් දකුණු ආසියාවේ වුව එතරම් කීර්ති නාමයක් හිමි වී නැති බව පිළිගත යුතු සත්‍යයකි.

එහෙත් මේ වනවිට ශ්‍රී ලංකාව ලොව ජය ගෙන ඇති ක්‍රිකට් ක්‍රීඩාවේ පවා 80 දශකය ආරම්භ වනතුරුම තිබුනේ දැනට පාපන්දු ක්‍රීඩාවට හිමිව ඇති තත්ත්වයමය. ඒ හරව අන්තර් ජාතික වශයෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ නියැලෙන රටවල් සංඛ්‍යාව අඩුවීමද ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර තලය කරා රැගෙන යාම පහසු කරවූ එක් හේතුවක් සේ සඳහන් කළ හැකිය. කෙසේ වුවත් 1979 වසරේ පැවැති ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී පස දස්කම් ශ්‍රී ලංකාවට 1982 වසරේ ක්‍රිකට්

අවම වශයෙන් දකුණු ආසියාතක රටවල හෝ වෘත්තීය මට්ටමින් පාපන්දු ක්‍රීඩාවේ නියැලීමට සුදුසු ක්‍රීඩකයින් පිරිසක් ශ්‍රී ලංකාවේ සිටින බව පවසන ඔහු එහෙත් ඒ සුදුසුකම්වලට සරිලන අවස්ථා ඔවුනට මෙතෙක් ලැබී නැති බවද කියා සිටියේය.

ක්‍රීඩාවේ ජාත්‍යන්තර දොරටු විවර කර දුන් අතර 1996 වසරේ ලෝක කුසලාන දිනා ගැනීමත් සමග ශ්‍රී ලංකා පිල ලොව ප්‍රබලම ක්‍රිකට් කණ්ඩායමක් බවට පත්විය. එහෙත් ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේත් වඩාත් ජනප්‍රිය පාපන්දු ක්‍රීඩාවය. උසස් හැකියාවන් ඇති පාපන්දු ක්‍රීඩකයින් රට තුළින් සොයා ගැනීමද අපහසු නැත. වර්තමානය පිළිබඳ කතා කරන විට ශ්‍රී ලංකා පිළේ සිටින හොඳම පෙර පෙළ ක්‍රීඩකයා ලෙස කසුන් ජයසුරිය හඳුන්වා දිය හැකිය.

රත්නම් පිල නියෝජනය කරන 26 හැවිරිදි කසුන් පාපන්දු ක්‍රීඩකයෙකු ලෙස ඔහු මෙතෙක් ආ සාර්ථක ගමන පිළිබඳවත් දේශීය පාපන්දු ක්‍රීඩාවේ අනාගතය වෙනුවෙන් කළ යුතු පිළියම් සම්බන්ධවත් ඔහුගේ හඬ අවදි කළේ මේ ආකාරයෙනි.

කඳුකරයට අයත් බදුල්ලේ ඉපිද එතිම අධ්‍යාපනය හැදෑරූ කසුන් පාසැලෙන් ක්‍රීඩා පිටියට පිවිස තිබුනේ හොකි, ක්‍රිකට් හා මැලල ක්‍රීඩාවන් සඳහාය. නමුත් ඉතා කෙටි කලකදී ඒ සියල්ල අතහැර ඔහු පාපන්දු ක්‍රීඩකයෙකු ලෙස පරිවර්තනය වී ඇත්තේ ගුරුවරයෙකුගේ උපදෙස් නිසාවෙනි. ඒ වනවිට සිය වැඩිමහල් සොහොයුරු පාපන්දු ක්‍රීඩාවේ නියැලී සිටි බැවින් කසුන් පාපන්දු ක්‍රීඩාව තෝරා ගැනීමට මැලි වූයේද නැත.

එතැන් සිට ඔහු විද්‍යාලීය අවුරුදු 12 න් පහල, 14ක් පහල, 17ත් පහල හා 19න් පහල යන පාපන්දු කණ්ඩායම් වල නායකත්වය දරමින් තම කුසලතාවන්ද ප්‍රේක්ෂකයා හමුවේ ප්‍රදර්ශනය කරන්නට සමත් වී තිබුණි. පෙර පෙළ ක්‍රීඩකයෙකු ලෙස ඔහු පෙන්වන ලද දක්ෂතා කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලය එක්වීමේ අවස්ථාවද කසුන් ජයසුරියට අත්කර දුන්නේය. අනතුරුව ආසියානු පාසල් පාපන්දු තරගාවලියටත් අවුරුදු 23 න් පහල ජාතික පිළටත් ක්‍රීඩා කළ හේ නොබෝ කලකින් ජාතික පිළේ ද නිත්‍ය සාමාජිකයෙකු බවට පත්විය.

ජාත්‍යන්තරය අවදි කළ හැක්කේ ජාතික පිළට ක්‍රීඩා කිරීමේ අවස්ථාව ලබා ගැනීම තුළිනි. කසුන් ශ්‍රී ලංකා පිළ තුළ පෙර පෙළ ක්‍රීඩකයෙකු ලෙස පෙන්වූ දස්කම් ඔහුට 2000 වසරේ මාලදිවයිනේ ක්‍රීඩා කිරීමේ අවස්ථාව ලබා දී තිබුණි.
ඔහු ඊළඟ වසරේද වෘත්තීය පාපන්දු ක්‍රීඩකයෙකු ලෙස මාලදිවයිනේම රැඳී සිටියේය. එතැන් සිට තවත් වසර දෙකක් ඉන්දියාවේ ක්‍රීඩා කිරීමේ අවස්ථාවද ඔහුට ලැබී ඇත.

පාපන්දු ක්‍රීඩකයෙකු වශයෙන් තම කුසලතා උපරිමයට රැගෙන යන්නට විදෙස් රටවල ක්‍රීඩා කිරීමට ලැබීම බෙහෙවින් උපකාර වූ බව කසුන්ගේ පිළිගැනීමය.
ශ්‍රී ලාංකික පාපන්දු ක්‍රීඩකයෙකුට ඉතා සඵලතාදායක තත්ත්වයක් බව ඔහුගේ අදහසය. තමන් විදෙස් රටවලදී ලබා ගත් අත්දැකීම් ශ්‍රී ලංකාව නියෝජනය කරන තරග වලදී ප්‍රයෝජනයට ගැනීම අපහසු වී ඇති බව පවසන කසුන් ඊට හේතුව ලෙස පෙන්වා දෙන්නේ එවැනි අත්දැකීම් සහිත ක්‍රීඩකයන්ගෙන් ශ්‍රී ලංකා පිළ සන්නද්ධව නොමැති වීමය.

දේශීය පාපන්දු ක්‍රීඩකයින්ට විදේශයෙන් හි ක්‍රීඩා කිරීමේ අවස්ථාව ලබාදීම තුළින් ඒ හිඩැස පියවා ගත හැකි බව ඔහු සඳහන් කළේය. එහෙත් පාපන්දු බලධාරීන් තවමත් ඒ සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම ඔහුගේ කනස්සල්ලට හේතුවී ඇත.
කෙසේ නමුත් පසුගියදා ශ්‍රී ලංකාවේ පැවැති 10 වැනි දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලංකා අවුරුදු 23 න් පහල පාපන්දු

pure Ceylon
Esher Tea
The Best Known name in Tea

කණ්ඩායම එකි විදි පදක්කම දිනා ගැනීමෙන් දේශීය පාපන්දු ක්‍රීඩාවේ අලුත් පරිච්ඡේදයක් ආරම්භ කර ඇති බව කසුන්ගේ පිළිගැනීමය.

අනුග්‍රාහකයින් සොයා ගනිමින් පාපන්දු ක්‍රීඩාවට දායකත්ව ප්‍රදායකයක් ලබාදිය හැකි නම් ඊට එක්වන තරුණ පිරිස සංඛ්‍යාත්මකව ඉහළ අගයක් වනු ඇතැයි කසුන් ජයසුරිය විශ්වාස කරයි.
වැඩිදෙනෙකු එකතු වන ක්‍රීඩාවක් වැඩි වැඩියෙන් ජනප්‍රිය වීමත් වැඩි වැඩියෙන් දියුණුවීමත් ස්වභාවික තත්ත්වයකි. කෙසේ වුවත් පාපන්දු ක්‍රීඩකයෙකුට සියයට 20 ක පමණ වාසනා ගුණයද තිබිය යුතු බව පිළිගන්නා ඔහු එහෙත් ක්‍රීඩාවට පිවිසෙන